# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2045/18 - 2017 නොවැම්බර් මස 15 වැනි බදාදා - 2017.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ යහලතැන්න සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 09 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1317.

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 460 රුවන්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රුවන්පුර ගමේ පිහිටි යහලතැන්නවත්ත, රුවන්පුර ජනපදය නමැති ඉඩම් වලින් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 6.5 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | මහ 3466 දරන මූලික පිඹුරේ කැබලි අංක 147 ; |
| *නැගෙනහිරට* | ඃ | මහ 3466 දරන මූලික පිඹුරේ කැබලි අංක 147 සහ රුවන්පුර - කුරුඳුවත්ත මාර්ගය ; |
| *දකුණට* | ඃ | මහ 3466 දරන මූලික පිඹුරේ කැබලි අංක 146 සහ රුවන්පුර - කුරුඳුවත්ත මාර්ගය ; |
| *බටහිරට* | ඃ | මහ 3466 දරන මූලික පිඹුරේ කැබලි අංක 146 සහ අශෝකා කල්‍යාණි රාජපක්ෂ මිය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* ඃ අශෝකා කල්‍යාණි රාජපක්ෂ මිය,
අංක 13/4, හෙට්ටියාවත්ත, හිරියලගම්මන, වැරැල්ලගම.

සහ

තිස්ස දිසානායක මහතා,
බැද්දේගම කන්ද, හිරියලගම්මන, වැරැල්ලගම.

11 - 1318


1A - G 26590 — 18 (2017/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*